තලවාකැලේ - ලිඳුල නගර සභාව - 2013
නුවරඑළිය දිස්ත්‍රික්කය
-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව ඔක්තෝබර් 21 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ - ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.
-----------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙලකර ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

සමාලෝචිත වර්ෂය අවසාන දිනට නව කාර්යාල ගොඩනැගිල්ලේ විෂයයන් 432ක් නීත්‍යානුකූලව පවරාගෙන එහි වත්කම් ගිණුම්ගතකර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්
--------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.45,129,834ක් විය. එයින් අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.2,141,162ක් වූ අතර ඉන් රු.78,797ක වසර 10 ඉක්මවා තිබූ ශේෂයන්ය.

1.3.4 ගෙවිය යුතු ගිණුම්
---------------------

2013 දෙසැම්බර් 31 දිනට අවු.01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,449,038ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.
-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.117,231ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

1.3.6 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.
-----------------------------------------------

තැන්පත් කර වසර 02ක් ඉක්මවූ රු.322,919ක් වටිනා තැන්පත් මුදල් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාමනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,085,826ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,696,552ක් වූයෙන් අතිරික්තයේ රු.610,726ක අඩුවීමක් දක්නට ලැබුණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2013.01.01 දිනට හිඟය | 2013.01.01 දිනට හිඟයෙන් අයකිරීම | 2013 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2013.12.31 දිනට හිඟ: 2013.01.01 දිනට පැවති හිඟ | 2013.12.31 දිනට හිඟ: වර්ෂයේ බිල්කිරීම් වලින් | 2013.12.31 දිනට හිඟ: මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 2,399,161 | 702,350 | 6,442,518 | 4,126,396 | 1,696,811 | 2,316,122 | 4,012,933 |
| බදු කුලී | 488,869 | 37,447 | 3,066,677 | 3,026,228 | 451,422 | 40,449 | 491,871 |

2.2.2 වරිපනම් බදු.

2013 දෙසැම්බර් 31 දිනට රු.4,012,933ක පැවති ශේෂයෙන් 2014 මැයි 30 දිනට අයවිය යුතු ශේෂය රු.2,375,104ක් අයකර ගැනීම සඳහා නගර සභා ආඥාපනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 100,834 |
| මුද්දර ගාස්තු | 82,500 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්.

2006 වර්ෂයේ මිලදීගත් රු.131,450ක් වටිනා කසල කැබලි කරන ඇග්‍රිටෙක් මල්ටි චොපර් යන්ත්‍රය මිලදීගෙන වසර 07ක කාලයක් ඉක්මවා ගොස් ඇතත් 2013 දෙසැම්බර් 31 දින තෙක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යයව තබා තිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය.

(අ). සාප්පු සංකීර්ණය ඉදිකිරිම.

විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය නොකර කොටස් 08ක් යටතේ නගර සභාව රු.15,000,000ක මුළුපිරිවැය ඇස්තමේන්තුවකට වනිගසේකර ප්‍රදේශයේ සාප්පු සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2013 ජූලි 20 දින ආරම්භකර 2014 මාර්තු 20 දින නිමකර භාරදීමට සැලසුම්කර ප්‍රදේශයේ සමිතියකට භාරදී තිබූ නමුත් 2014 මැයි 31 දින වන විටද වැඩ නිමකර නොතිබුණි.

(ආ). ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද

---------------------------------------

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් දක්නට ලැබුණි.

3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය.

------------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර, පරිසරයට හානිකර පරිදි කසළ බැහැර කරමින් පැවතුණි.

3.4 අධිභාර

--------

නගර සභා ආඥාපනතේ (255වන අධිකාරය) 182(1) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව ම විසින් පනවන ලද අධිභාර අනුව 2013 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු.7,867ක් විය.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය.

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමහ සැසැඳීමේදී ආදායම් විෂයයන් 07ක සියයට 8 සිට සියයට 108 දක්වාද වියදම් විෂයයන් 07ක සියයට 41 සිට සියයට 119 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.
(ආ). අභ්‍යන්තර පාලනය.
(ඇ). ආදායම් පරිපාලනය.
(ඈ). ණයගැති ණයහිමි පාලනය.
(ඉ). වත්කම් කළමනාකරණය.